# ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම

## <u>ශිෂ්‍යත්ව ඉල්ලුම්පත පිරවීම සඳහා උපදෙස්</u>

*(ශිෂ්‍යත්ව ඉල්ලුම්පත පිරවීමට පෙර, පහත සඳහන් උපදෙස් සැලකිලිමත්ව කියවන්න)*

1. පසුගිය වසරේ අ.පො.ස (සා.පෙ) විභාගයට පළමු වරට පෙනී සිට, අවම වශයෙන් විෂයයන් 5 කට **A** සාමාර්ථ නොමැති නම්, ඔබගේ ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් **අවම සුදුසුකම් නොමැති නම් කරුණාකර මෙම ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් නොකරන්න.**

2. **අයදුම්කරුගේ සම්පූර්ණ නම**: මෙම නම, අ.පො.ස විභාග ප්‍රතිඵල සහතිකයේ තිබෙන නම සමග ගැලපිය යුතුය.

3. **ඊ-මේල් (තිබේ නම්)**: ඔබගේ ඉල්ලුම්පතේ යම් අපැහැදිලි කරුණක් වෙතොත්, එය ඉක්මනින් පැහැදිලි කර ගැනීමට මෙය ඉතා වැදගත්ය. ඊ-මේල් ලිපිනයක් දක්වතොත් එය නිතර බලා ඉක්මනින් පිලිතුරු සපයන ලිපිනයක් විය යුතුය.

4. **දුරකථන අංක (තිබේ නම්):** මෙය ප්‍රදේශ අංකය (Area Code) සමග විය යුතුය. ඔබ නිවසේ දුරකථනයක් නැතිනම්, ඔබගේ විශ්වාශවන්ත ඥාතිවරයකුගේ, අසල්වාසියකුගේ හෝ ගුරුවරයකුගේ දුරකථන අංකයක්, එය කවරකුගේද කියා සඳහන් කොට දක්වන්න.

   උදාහරණයක් වශයෙන්, ඔබ කොළඹ ප්‍රදේශයේ අසල්වාසියකුගේ දුරකථන අංකයක් සඳහන් කලහොත් එය ”(11) 2223333 (අසල්වාසී)” ලෙස දක්වන්න. දුරකථන අංකයක් නැති විට, ඔබගේ ඉල්ලුම්පතේ යම් අපැහැදිලි කරුණක් වෙතොත්, එය ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

5. **උපන් දිනය (දිනය/මාසය/වසර)**: ඔබගේ උපන් දිනය උදාහරණයක් වශයෙන්, අප්‍රියෙල් 3, 1994 නම්, එය “03 අප්‍රියෙල් 1994” ලෙස දක්වන්න. එය 3.4.94 හෝ 4.3.94 ලෙස සඳහන් කලහොත්, නිවැරදි දිනය සහ මාසය කුමක්ද කියා පැහැදිලි නැත.

6. **G.C.E. (O/L) විෂයයන් සහ ප්‍රතිඵල**: ඔබගේ ප්‍රතිඵල සහතිකයේ ඡායා පිටපතක් ගෙන, එය සත්‍ය පිටපතක් බවට විදුහල්පති තුමා මගින් රබර් මුද්‍රාව සහිතව සහතික කල යුතුය. සමහර සිසුන්, විදුහල්පති තුමා අත්සන් කල, රබර් මුද්‍රාව සහිත ප්‍රතිඵල සහතිකයක ඡායා පිටපතක් එවති. එම ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ප්‍රතිඵල සහතිකයේ මුල් පිටපත් එවිය නොයුතුය.

7. **පවුලේ සාමාජිකයන්ගේ විස්තර සහ ඔවුන්ගේ මුලු මාසික ආදායම:** ඔබ පවුලේ සියලුම සාමාජිකයන්ගේ විස්තරත්, ඔවුන්ගේ රැකියාවල් සහ මුලු මාසික ආදායමත් **සංඛ්‍යාත්මකව** (අඩුකිරීම් වලට පෙර සහ වෙනත් ශිෂ්‍යත්ව මුදල්, සමුර්ධි සහනාධාර, ආදී සැම ඇතුලත්ව) සඳහන් කරන්න. මෙම විස්තරත් (රැකියාවල් ඇතුලුව), පවුලේ **මුලු ආදායමත් සංඛ්‍යාත්මකව ග්‍රාම නිලධාරිතුමා අත්සන් කොට රබර් මුද්‍රාව තබා සහතික කල යුතුය.** මෙසේ සහතික නොකල අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   රජයේ හෝ වෙනත් ආයතනවල රැකියාවල නියුතු (හෝ, එවැනි ආයතනවලින් විශ්‍රාම ලැබූ) පවුලේ සාමාජිකයන් වෙතොත්, ඔවුන්ගේ අලුත්ම වැටුප් පිටපත්වල ඡායා පිටපත් ග්‍රාම නිලධාරිතුමා අත්සන් කොට රබර් මුද්‍රාව තබා සහතික කර ඇමිනිය යුතුය. ස්ථිර ආදායමක් නොමැති හෝ ස්වයං රැකියාවල නියුතු පවුලේ සාමාජිකයන් වෙතොත්, ඔවුන්ගේ දල මාසික ආදායම (නොයෙකුත් අඩුකිරීම් වලට පෙර) ඉල්ලුම්පතේ සඳහන් කර, ග්‍රාම නිලධාරිතුමා අත්සන් කොට රබර් මුද්‍රාව තබා සහතික කල යුතුය.

8. සිසුන් තෝරා ගැනීමේදී අප විසින් සැලකිල්ලට ගතයුතු විශේෂ කරුණු තිබේ නම් (උදාහරණයක් වශයෙන්, මිය ගිය දෙමාපියන්, හෝ අංගවිකල, ආබාධිත පවුලේ සාමාජිකයන් වෙතොත්) එම විස්තර සඳහන් පත්‍රිකාවක් වෙනම අමුනන්න.

9. තෝරා ගත් සිසුන්ට පමණක් ජුලි - අගෝස්තු පමණ කාලසීමාවේදී ලිපි මගින් දැනුම් දෙනු ලැබේ. ඉල්ලුම්පත් විශාල සංඛ්‍යාවක් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බැවින් එම සිසුනට දැනුම්දීමක් කරනු නොලැබේ.

10. අ.පො.ස විභාග ප්‍රතිඵලවලට අමතරව අනෙක් **බාහිර කටයුතු** (ක්‍රීඩා, කථික තරඟ, ආදිය) **පිළිබඳ සහතික කිසිවක් ඇමිනිය නොයුතුය.** මෙම බාහිර කටයුතු සිසුනගේ වර්ධනයට ඉතාමත් වැදගත් වුවද, එවා නිසි අයුරින් ඇගයීම සිසුන් තෝරා ගැනීමේදී අප හට ඉතා අපහසු බැවින්, අ.පො.ස විභාග ප්‍රතිඵලත්, පවුලේ තොරතුරු සහ ආදායමත් (වෙනත් විශේෂ කරුණුත්) පමනක් සලකනු ලැබේ.

11. ඔබගේ අයදුම් පත සහ විදුහල්පති තුමා අත්සන් කොට රබර් මුද්‍රාව සහිතව සහතික කල අ.පො.ස ප්‍රතිඵල සහතිකයේ ජායා පිටපතක්, අවසන් දිනට (සාමාන්‍යයෙන් මැයි මස මැද්දී පමන) පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට එවන්න.

    දේවිකා ජයවර්ධන මහත්මිය
    සම්බන්ධිකරණ ලේකම්, ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම
    125/14 පීටර්සන් පටුමග
    කොළඹ 6

    ඔබගේ අයදුම්පත අපට ලැබීමට දින 2-3 ක පමණ කාලයක් ගත විය හැකි බැවින්, එය ඉල්ලුම්පත් බාර ගන්නා අවසාන දිනට දින කීපයකට පෙර තැපැල් කල යුතුය. එය ලියා පදිංචි තැපෑලෙන් එවීම අත්‍යාවශ්‍ය නැත.

<u>**ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන ප්‍රධාන කරුණු**</u> :

a. අවම සුදුසුකම් නොමැති වීම
b. විභාග ප්‍රතිඵල සහතිකයේ ජායා පිටපත, සත්‍ය පිටපතක් බවට විදුහල්පති තුමා අත්සන් කොට රබර් මුද්‍රාව සහිතව සහතික නොකිරීම. (විදුහල්පති තුමා අත්සන් කරන ලද, රබර් මුද්‍රාව සහිත ප්‍රතිඵල සහතිකයක ජායා පිටපත් ප්‍රතික්ෂේප කෙරේ.)
c. පවුලේ සියලු විස්තර සහ **සංඛ්‍යාත්මකව** මුලු මාසික ආදායම ග්‍රාම නිලධාරිතුමා අත්සන් කොට රබර් මුද්‍රාව තබා සහතික නොකිරීම
d. රජයේ හෝ වෙනත් ආයතනවල රැකියාවල නියුතු (හෝ, එවැනි ආයතනවලින් විශ්‍රාම ලැබූ) පවුලේ සාමාජිකයන්ගේ අලුත්ම වැටුප් පිටපත්වල ජායා පිටපත් ග්‍රාම නිලධාරිතුමා අත්සන් කොට රබර් මුද්‍රාව තබා සහතික කර නොතිබීම

*නිසි ප්‍රමාණ මුල්‍යාධාර නොමැති කම නිසා ඔබ හට මෙවර ශිෂ්‍යත්වයක් පිරිනැමීමට නොහැකි වෙතොත්, අප ඔබගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක වේවා යි ඉත සිතින් පතමු!*